# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: BD/GPS/13/03/04/2022
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2022.03. 02

**ජාතික අයවැය චක්‍රලේඛ අංක : 01/2022**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/දිස්ත්‍රික් ලේකම්වරුන්,
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**<u>රාජ්‍ය ආයතන විසින් මෙහෙයුම් කල්බදු පදනම යටතේ ලබාගත් වාහනවල ගිවිසුම් කාලය දීර්ඝ නොකිරීම</u>**

අංක 1/2016 සහ 3/2018 දරන ජාතික අයවැය දෙපාර්තමේන්තු චක්‍රලේඛ විධිවිධාන යටතේ රාජ්‍ය ආයතන විසින් මෙහෙයුම් කල්බදු පදනම යටතේ ලබාගත් වාහනවල අදාල වසර 05 ක ගිවිසුම් කාල සීමාව අවසන් වීමෙන් පසුව, ගිවිසුම් කාලය නැවත දීර්ඝ නොකිරීමට අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 22/0042/304/003 දරන 2022-01-18 දිනැති තීරණය මඟින් අමාත්‍ය මණ්ඩලය තීරණය කර තිබේ.

02. ඒ අනුව, දැනට රාජ්‍ය ආයතන විසින් මෙහෙයුම් කල්බදු පදනම මත ප්‍රසම්පාදනය කර ගෙන ඇති වාහනවල ගිවිසුම්ගත කාලය අවසන් වූ පසුව ඒවා තවදුරටත් දීර්ඝ කිරීමට කටයුතු නොකළ යුතුය.

03. ඒ හේතුවෙන් අත්‍යාවශ්‍ය වාහනවල යම් හිඟයක් ඇතිවුවහොත් ඒ සඳහා වන ඉල්ලීමක් අදාල ප්‍රධාන ගණන්දීමේ නිළධාරියාගේ නිර්දේශය සහිතව ආයතන ප්‍රධානීන් විසින් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කළ යුතුය.

04. රාජ්‍ය ආයතන සඳහා මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන ලබා ගැනීම සඳහා මාර්ගෝපදේශ ඇතුළත් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2016.03.17 දිනැති අංක 1/2016 සහ 2016.09.19 දිනැති අංක 1/2016(i) දරණ චක්‍රලේඛයන්, රාජ්‍ය ආයතන සඳහා මෝටර් වාහන ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2018.07.16 දිනැති අංක 03/2018 ජාතික අයවැය චක්‍රලේඛය මඟින් අවලංගු කර ඇත. මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන සපයා ගැනීමට විධිවිධානයන් ඇතුළත් ඉහත 03/2018 චක්‍රලේඛයේ 5 (ඇ) වගන්තිය මෙයින් අවලංගු කරනු ලැබේ.

**එස්.ආර්. ආටිගල**
භාණ්ඩාගාර ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති